# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.20 පැය 1020 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/99 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. කේරළ ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.01.19 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 05 මිලිග්‍රෑම් 45 ක් සන්තකයේ තබාගෙන ත්‍රිරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 33 වයස් වල පසුවන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වැල්ලම්පිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මෙම වැටලීමට අදාළ ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**02. පුරාවස්තු සෙවීමේ අදහසින් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුර.**

2025.01.19 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාවනැල්ල පොලිස් වසමේදී වැටලීමක් සිදු කර මුතුගල ප්‍රදේශයේ පුරාවස්තු සෙවීමේ අදහසින් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන මාවනැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 හා 38 වයස් වල පසුවන මාතලේ, මාවනැල්ල ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

මාවනැල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2025.01.19 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහබාගේ පොලිස් වසමේ මත්තුමගල ප්‍රදේශයේ වැටලීමක් සිදු කර නීති විරෝධි මත්පැන් ලීටර් 22 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහබාගේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන මන්තුමගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මහබාගේ පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**